# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2007/27 - 2017 පෙබරවාරි මස 22 වැනි බදදා - 2017.02.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත

**4 (2) උපවගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, 1995 අංක 15දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනතේ අරමුණ සඳහා SLFRS 01 සංශෝධන, SLFRS 12 සංශෝධන සහ LKAS 28ට සංශෝධනවලින් සමන්විත 2016 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට (SLFRSs) වාර්ෂික වැඩි දියුණු කිරීම් ආයතනය විසින් සම්මතකර මේ සමඟ පළකර ඇත. මෙම සංශෝධන වර්ෂ දෙදහස් දහහතේ ජනවාරි 01 දිනයෙන් පසු (SLFRS 12) සහ දෙදහස් දහඅටේ ජනවාරි 01 දිනයෙන් පසු (SLFRS 1සහ LKAS 28) ආරම්භ වන කාල පරිච්ඡේද ආවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශන සඳහා බලාත්මක කළ යුතුයි. කලින් ව්‍යවහාර කිරීම සඳහා ඉඩදෙයි.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

අරුණ අල්විස්,
ලේකම්.

2017 පෙබරවාරි මස 22 දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30 ඒ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ දී ය.

## 2016 හි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRSs) වාර්ෂික වැඩි දියුණු කිරීම්

### පටුන

SLFRS 1ට වැඩි දියුණු කිරීම් - *ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මුල්වරට සම්මත කර ගැනීම*

SLFRS 12ට වැඩි දියුණු කිරීම් - *වෙනත් අස්තිත්වයන්හි හිමිකම් හෙළිදරව් කිරීම*

LKAS 28ට වැඩි දියුණු කිරීම් - *ආශ්‍රිත සහ බද්ධ ව්‍යාපාරයන්හි ආයෝජන*

### මෙම ප්‍රමිති මගින් ආමන්ත්‍රණය කරන දෑ

මෙම සංශෝධන මගින් ආමන්ත්‍රණය කරන මාතෘකා පහත වගුවේ දැක්වේ.

| ප්‍රමිතිය | සංශෝධිත විෂය |
|---|---|
| SLFRS 1 *ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මුල්වරට සම්මත කරගැනීම* | පළමුවරට අනුගමනය කරන්නන් සඳහා වූ කෙටිකාලීන නිදහස්වීම් ඉවත් කිරීම |
| SLFRS 12 *වෙනත් අස්තිත්වයන්හි හිමිකම් හෙළිදරව් කිරීම* | ප්‍රමිතියේ විෂය පථය පැහැදිලි කිරීම |
| LKAS 28 *ආශ්‍රිත සහ බද්ධ ව්‍යාපාරයන්හි ආයෝජන* | ආශ්‍රිතයක් හෝ බද්ධ ව්‍යාපාරයක් සාධාරණ අගයට මැනීම |

## SLFRS 1 *ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මුල්වරට සම්මත කර ගැනීමට සංශෝධන*

39L ඡේදය සංශෝධනය කර ඇති 39අඅ ඡේදය ඉවත් කර 39අඇ ඡේදය අලුතින් එකතු කර ඇත. ඉවත් කරන පාඨ තනි ඉරකින් කපාහැර ඇති අතර අළුත් පාඨ යටින් ඉරක් ඇඳ ඇත.

### බල පැවැත්වෙන දිනය

...

39L LKAS 19 සේවක ප්‍රතිලාභ (2013දී සංශෝධනය කල පරිදි) ඇ1 ඡේදයේ සංශෝධන කරන ලද අතර ඇ10 සහ ඇ11 ඡේද ඉවත් කර ඇත. අස්තිත්වයක් LKAS 19 (2013 සංශෝධනය කල පරිදි) ව්‍යවහාර කරන විට එම සංශෝධන ව්‍යවහාර කළ යුතුය.

...

39අඅ [ඉවත් කරන ලදී]

...

39අඇ 2017 ජනවාරි නිකුත් කල 2016 *SLFRSsවලට වාර්ෂික වැඩිදියුණු කිරීම්*, 39L ඡේදය සංශෝධන කර, 39අඅ සහ ඉ3-ඉ7 ඡේද ඉවත් කරන ලදී. අස්තිත්වයක් 2018 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන කාලපරිච්ඡේද සඳහා මෙම සංශෝධන ව්‍යවහාර කළ යුතුය.

ඊ පරිෂ්ඨයේ ඉ3-ඉ7 ඡේද සහ ඒ සම්බන්ධ මාතෘකා ඉවත් කරන ලදී.

### ඊ පරිශිෂ්ඨය

## SLFRSs වලින් කෙටිකාලීන නිදහස්වීම්

මෙම පරිශිෂ්ඨය SLFRSsවල අත්‍යවශ්‍ය කොටසකි.

**~~මූල්‍ය සාධනපත්‍ර පිළිබඳ හෙළිදරව් කිරීම්~~**

ඉ3 [ඉවත් කරන ලදී.]

ඉ4 [ඉවත් කරන ලදී.]

ඉ4අ [ඉවත් කරන ලදී.]

**~~සේවක ප්‍රතිලාභ~~**

ඉ5 [ඉවත් කරන ලදී.]

**~~ආයොජන අස්තිත්ව~~**

ඉ6 [ඉවත් කරන ලදී.]

ඉ7 [ඉවත් කරන ලදී.]

## SLFRS 12 අනෙකුත් අස්තිත්වයන්හි හිමිකම් හෙළිදරව් කිරීම

| 5අ ඡේදය අලුතින් එකතු කර ඇත. |
|---|

### විෂය පථය

…

5අ ආ17ඡේදයේ විස්තර කර ඇති පරිදි හැර, SLFRS 5 – *විකිණීම සඳහා තබාගෙන ඇති ජංගම නොවන වත්කම් සහ අසන්තතික මෙහෙයුම්* අනුව විකිණීම සඳහා තබාගෙන ඇති හෝ අසන්තතික මෙහෙයුම් ලෙස (හෝ බැහැර කිරිමේ කාණ්ඩයක් ලෙස වර්ග කිරිම තුල ඇතුලත් කල) වර්ග කල 5 ඡේදයේ ලැයිස්තුගත අස්තිත්වයක හිමිකම්වලට මෙම SLFRS හි අවශ්‍යතාවයන් ව්‍යවහාර කරයි.

| ආ පරිශිෂ්ඨයේ ආ17 ඡේදය සංශෝධන කර ඇත. ඉවත් කරන පාඨ තනි ඉරකින් කපාහැර අතර අළුත් පාඨ යටින් ඉරක් ඇඳ ඇත. |
|---|

### පරිපාලිත, බද්ධ ව්‍යාපාර සහ ආශ්‍රිත සඳහා සංක්ෂිප්ත මූල්‍ය තොරතරු (12 සහ 21ඡේද)

…

ආ17 පරිපාලිතයක, බද්ධ ව්‍යාපාරයක හෝ ආශ්‍රිතයකට ඇති අස්තිත්වයකට ඇති හිමිකම් (හෝ බද්ධ ව්‍යාපාරයක හෝ ආශ්‍රිතයක ඇති එහි හිමිකමේ කොටසක්) SLFRS 5 අනුව විකිණීම සඳහා තබාගෙන ඇති ලෙස (හෝ බැහැර කිරීමේ කාණ්ඩයක් ලෙස වර්ග කිරිම තුල ඇතුලත් කල) වර්ගීකරණය කලවිට, අස්තිත්වය විසින් එම පරිපාලිතය ,බද්ධ ව්‍යාපාරය හෝ ආශ්‍රිතය සඳහා ආ10-ආ11 ඡේද අනුව සාරංශ ගතකළ මූල්‍ය තොරතරු හෙළිදරව් කිරිම අවශ්‍ය නොවේ.

| ඇ පරිශිෂ්ඨයේ ඇ1ඇ ඡේදය අලුතින් එකතු කර ඇත. |
|---|

### බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය

…

ඇ1ඇ 2017 ජනවාරි නිකුත් කල *2016 SLFRSsවලට වාර්ෂික වැඩිදියුණු කිරීම්* 5අ ඡේදය අලුතින් එකතු කර ආ17 ඡේදය සංශෝධන කර ඇත . අස්තිත්වයක් LKAS 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවලට

වෙනස්වීම් සහ වැරදි අනුව, 2017 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන කාලපරිච්ඡේද සඳහා අතීතානුයෝගිව මෙම සංශෝධන ව්‍යවහාර කලයුතුයි.

## LKAS 28 ආශ්‍රිත සහ බද්ධ ව්‍යාපාරයන්හි ආයෝජන සංශෝධන

18 සහ 36අ ඡේද සංශෝධන කර ඇති අතර 45ඉ ඡේදය අලුතින් එකතු කර ඇත. ඉවත් කරන ලද පාඨ තනි ඉරකින් කපා හරින අතර අළුත් පාඨ යටින් ඉරක් ඇඳ ඇත.

### ස්කන්ධ ක්‍රමය ව්‍යවහාරයෙන් නිදහස්වීම්

…

18 ආශ්‍රිතයක හෝ බද්ධ ව්‍යාපාරයක ආයෝජනයක් තබා ගන්නා විට හෝ ආයෝජන සම්බන්ධ රක්ෂණ අරමුදල් ඇතුළුව අස්තිත්වයක් අවදානම් ප්‍රාග්ධන ආයතනයක් හෝ අන්‍යොන්‍ය අරමුදලක්, ඒකක භාරයක් සහ ඒ සමාන අස්තිත්ව තුලින් වක්‍රාකාරව තබා ගන්නා විට, අස්තිත්වය එම ආයෝජනය SLFRS 9 අනුව ලාභය හෝ අලාභය තුලින් සාධාරණ වටිනාකමට මැනීමට තෝරා ගත හැකිය. අස්තිත්වයක් ආශ්‍රිතය හෝ බද්ධ ව්‍යාපාරය මූල්වරට හඳුනා ගැනීමේදි එක් එක් ආශ්‍රිතය හෝ බද්ධ ව්‍යාපාරය සඳහා වෙන වෙනම තෝරා ගැනීම සිදු කල යුතුයි.

…

### ස්කන්ධ ක්‍රමයේ ක්‍රියාපටිපාටින්

…

36අ 36 ඡේදයේ අවශ්‍යතාවය කෙසේ වුවත්, ආයෝජන අස්තිත්වයක්ම නොවන අස්තිත්වයකට ආයෝජන අස්තිත්වයක් වන ආශ්‍රිතයක හෝ බද්ධ ව්‍යාපාරයක හිමිකමක් ඇතිවිට අස්තිත්වය විසින් ස්කන්ධ ක්‍රමය ව්‍යවහාර කිරිමේදි එම ආයෝජන අස්තිත්ව, ආශ්‍රිතය හෝ බද්ධ ව්‍යාපාරය විසින් එම ආයෝජන අස්තිත්ව ආශ්‍රිතයට හෝ බද්ධ ව්‍යාපාරයට පරිපාලිතවල ඇති හිමිකම් සඳහා ව්‍යවහාර කළ සාධාරණ අගය මැනීම තවදුරටත් රඳවා ගැනීම තෝරා ගත හැකිය. මෙම තෝරා ගැනීම (අ) ආයෝජන අස්තිත්ව ආශ්‍රිතය හෝ බද්ධ ව්‍යාපාරය මූල්වරට හඳුනාගන්නා දිනය (ආ) ආශ්‍රිතය හෝ බද්ධ ව්‍යාපාරය ආයෝජන අස්තිත්වයක් බවට පත් වන දිනය සහ (ඇ) ආයෝජන අස්තිත්ව ආශ්‍රිතය හෝ බද්ධ ව්‍යාපාරය මුලින්ම පරිපාලකයක් බවට පත් වන දිනය යනාදියෙන් පසුව ඇති වන දිනයට එක් එක් ආයෝජන අස්තිත්ව ආශ්‍රිතය හෝ බද්ධ ව්‍යාපාරය සඳහා වෙන වෙනම සිදු කරනු ලැබේ.

…

### බල පැවැත්වෙන දිනය සහ සංක්‍රාන්තිය

45ඉ 2017 ජනවාරි නිකුත් කල *2016 SLFRSsවලට වාර්ෂික වැඩිදියුණු කිරීම්*, ඡේද 18 සහ 36අ ඡේද සංශෝධනය කරයි. අස්තිත්වයක් 2018 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා LKAS 8 අනුව අතීතානුයෝගිව මෙම සංශෝධන ව්‍යවහාර කල යුතුය. කලින් ව්‍යවහාර කිරිම සඳහා ඉඩදෙනු ලැබේ. කලින් කාලපරිච්ඡේදයක් සඳහා අස්තිත්වයක් මෙම සංශෝධන ව්‍යවහාර කරයි නම් එය හෙළිදරව් කල යුතුයි.

03-1080

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.